FINANCIAL MANAGEMENT (Part-I)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

<u>මූල්‍ය කළමනාකරණය</u>

ව්‍යාපාර ආයතනයට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ගවලින් සපයා ගැනීමේ හා එම අරමුදල් ඵලදායි ලෙස ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කරමින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීමේ සියලු කළමනාකරණ කටයුතු මූල්‍ය කළමනාකරණය ලෙස හැඳින්විය හැකි ය.

<u>මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්ය</u>

අවශ්‍ය අරමුදල් පිළිබඳ සැලසුම් කිරිම, එම අවශ්‍යතා අනුව අරමුදල් සම්පාදනය කර ගැනීම සහ ඒවා සඵලදායක හා කාර්යක්ෂම ලෙස භාවිත කිරීම මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්ය වේ.

ClassWork.LK

මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ

මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ ව්‍යපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම යි.

නිදසුන :

සමාගමක අගය නැතහොත් වටිනාකම වැඩි වන විට එම සමාගමේ කොටස්වල මිල ඉහළ යයි. සමාගමක හිමිකරුවන් වන්නෝ සාමාන්‍ය කොටස් හිමියෝ ය. ඒ අනුව සාමාන්‍ය කොටස්වල මිල ඉහළ යාමෙන් පෙන්නුම් කරන්නේ අයිතිකරුවන්ගේ ධනය ඉහළ යාමයි. කේවල ස්වාමි ව්‍යාපාරයක අගය නැතහොත් ධනය ඉහළ යාම යනුවෙන් පෙන්විය හැක්නේ එම ව්‍යාපාරය ඉහළ වටිනාකමකට අලෙවි කළ හැකි බව යි.

ClassWork.LK

වෙනත් අරමුණු

ඉහත මූලික අරමුණට අමතරව පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට ද මූල්‍ය කළමනාකරණය මගින් අපේක්ෂා කෙරේ.

- ලාභය උපරිම කිරීම
- කොටසක ඉපයුම උපරිම කිරීම
- දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම
- ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම

ClassWork.LK

මූල්‍ය කළමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ

මූල්‍ය කළමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ වර්ග දෙකකි.

1. මූල්‍යන තීරණ
2. ආයෝජන තීරණ

මූල්‍යන තීරණ

ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ තීරණ මූල්‍යන තීරණ වේ. එනම් අවශ්‍ය මූල්‍ය සම්පාදනය කර ගන්නේ කෙසේ ද යන්නයි.

ආයෝජන තීරණ

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල යෙදවීම පිළිබඳ ව ගනු ලබන තීරණ ආයෝජන තීරණ වේ. සම්පාදනය කර ගත් අරමුදල් ව්‍යාපාරයේ විවිධ අවශ්‍යතා අතර යොදවන්නේ කෙසේද යන්නයි.

ClassWork.LK

මූල්‍ය කළමනාකරණ තීරණ ගැලීම් සටහනක් ඇසුරෙන්

- මූල්‍ය කළමනාකරණ තීරණ
  - ආයෝජන තීරණ
    - දිගුකාලීන තීරණ
      - ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ
      - නැවත ස්ථාපනය කිරීම පිළිබඳ තීරණ
      - ව්‍යාපාර වැඩි දියුණු කිරීම පිළිබඳ තීරණ
      - ව්‍යාපාර විවිධාංගීකරණය පිළිබඳ තීරණ
    - කෙටිකාලීන තීරණ
      - මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
      - ණයගැතියින් පිළිබඳ තීරණ
      - වෙළෙඳ තොග පිළිබඳ තීරණ
      - වෙනත් කෙටිකාලීන ආයෝජන පිළිබඳ තීරණ
  - මූල්‍යන තීරණ
    - දිගුකාලීන තීරණ
      - ප්‍රාග්ධන ව්‍යුහය (ප්‍රාග්ධන මිශ්‍රය) පිළිබඳ තීරණ
        - ණය ප්‍රාග්ධනය ලබාගැනීම පිළිබඳ තීරණ
        - හිමිකම් ප්‍රාග්ධනය රැස් කිරීම පිළිබඳ තීරණ
        - ණය හා හිමිකම් ප්‍රාග්ධන අනුපාතය පිළිබඳ තීරණ
      - ලාභාංශ පිළිබඳ තීරණ
        - රඳවාගැනීම් පිළිබඳ තීරණ
        - ලාභාංශ විභජනය පිළිබඳ තීරණ
    - කෙටිකාලීන තීරණ
      - වෙළෙඳ ණය හිමියන් පිළිබඳ තීරණ
      - බැංකු අයිරා හා අනෙකුත් කෙටිකාලීන බැංකු ණය පිළිබඳ තීරණ
      - ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ

ClassWork.LK

මූල්‍ය කළමනාකරණ තීරණ

මූල්‍ය කළමනාකරණ තීරණ අනුව අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරය හා ඒවා ආයෝජනය කරන ආකාරය හඳුනා ගත් පසු යෝග්‍ය පරිදි අරමුදල් සපයා ගෙන ඒවා සචලදායි මාර්ගවල ආයෝජනය කළ යුතු ය.

මූල්‍යන තීරණ හා ආයෝජන තීරණ ප්‍රශස්ත ලෙස සිදු වුවහොත් මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණ වූ අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීම මනා ව ඉටු වේ.

මේ සඳහා මූල්‍ය සැලසුම්කරණය හා පාලනය අත්‍යවශ්‍ය වේ. මූල්‍ය සැලසුම්කරණ හා පාලන උපකරණ ලෙස අයවැයකරණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ යොදා ගනී.

ClassWork.LK

අයවැයකරණයේ දී යොදා ගන්නා ප්‍රධාන උපකරණ

- මුදල් අයවැය ලේඛනය - Cash Budget
- ප්‍රාග්ධන අයවැයකරණය - Capital Budgeting

මුදල් අයවැය ලේඛනය

නිශ්චිත අනාගත කාලච්ඡේදයක මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ඇතුළත් කොට සකස් කරනු ලබන ලේඛනය මුදල් අයවැය ලේඛනය ලෙස හඳුන්වනු ලැබේ. මුදල් අයවැය ලේඛනයක දැකිය හැකි අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ගවලට නිදසුන් පහත දැක්වේ.

ClassWork.LK

අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ග

නිදසුන් :

- අත්පිට විකුණුම්
- ජංගම නොවන වත්කම් විකිණීම
- ණයගැතියන්ගෙන් ලැබීම්

අපේක්ෂිත ගෙවීම්වලට නිදසුන් පහත දැක්වේ.

අපේක්ෂිත ගෙවීම්

නිදසුන් :

- තොග මිලට ගැනීම්
- වැටුප් හා වේතන ගෙවීම්
- ජංගම නොවන වත්කම් මිල දී ගැනීම්

ClassWork.LK

මුදල් අයවැය ලේඛනයක් පිළියෙළ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන

- අනාගතයේ දී මුදල් අතිරික්තයක් වේ නම්, එය කල් තබා දැනගත හැකි වීමෙන් එම මුදල් ඵලදායි ව ආයෝජනය කළ හැකි වීම

- අනාගතයේ දී මුදල් ඌනතාවක් වේ නම්, එය ද කල් තබා දැන ගෙන ඊට මුහුණ දීමට සූදානම් විය හැකි වීම

- සත්‍ය මුදල් ක්‍රියාකාරීත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැලසුම්කරණය හා පාලනය පහසු වීම

- ව්‍යාපාරික ණය ලබා ගැනීම ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්ත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් වීම

ClassWork.LK

ප්‍රාග්ධන අයවැයකරණය

අනාගතයේ දී ප්‍රතිලාභ ඉපයීමේ අරමුණෙන් ව්‍යාපාර ආයතනයක් සතු ව පවතින වර්තමාන අරමුදල්, වඩා සඵලදායි ලෙස දිගු කාලීන වත්කම්වල හෝ දිගුකාලීන ව්‍යාපෘතිවල හෝ ආයෝජනය කිරීමට සැලසුම් කිරීම ප්‍රාග්ධන අයවැයකරණය වේ.

දිගු කාලීන ආයෝජන තීරණ

මූල්‍ය කළමනාකරු විසින් ගනු ලබන ප්‍රාග්ධන අයවැයකරණ තීරණ දිගු කාලීන ආයෝජන තීරණ ලෙස සැලකේ.

නිදසුන් :

- ව්‍යාපාර කටයුතු වර්ධනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම.
- නව යන්ත්‍රයක් මිලට ගැනීම.
- ප්‍රචාරණ වැඩ සැලැස්මක් සඳහා වැය කරන දිගු කාලීන වියදම්

ClassWork.LK

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

යම් පසුගිය කාලච්ඡේදයක් තුළ ආයතනයකට සත්‍ය හෝ අපේක්ෂිත හෝ මුදල් ගලා ඒම් සිදු වූ ආකාරය හා එකී මුදල් ගලා යාම් සිදු වූ ආකාරය විශ්ලේෂණය කර දැක්වෙන ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය යි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පසුගිය කාලසීමාවක් සඳහා හෝ අනාගත කාලසීමාවක් සඳහා හෝ පිළියෙළ කළ හැකි ය. ව්‍යාපාරයක මුදල් ප්‍රවාහය නැතහොත් මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් සිදු වූ ආකාරය එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට හෝ බලපායි. එම නිසා මුදල් ප්‍රවාහය පාලනය කිරීම සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයතනයට වැදගත් වේ.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura